**ශීර්ෂය - 434 ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 24 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| **ඡේද යොමුව** | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** |
|---|---|---|
| 1.6 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලතායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 29 දිනැති අංක 2021/03 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 7.7 ඡේදය ප්‍රකාර දේපළ පිරියත හා උපකරණ අගයට සමාන වටිනාකමක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ සංචිත ලෙස දැක්විය යුතු වුවත් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය | විගණනයෙන් පෙන්වා දී ඇති එම දෝෂය නිවැරදි කර ගැනීමෙන් පසු සංචිකයේ වටිනාකම නිවැරදි වනු ඇති බව කාරුණිකව වාර්ති කරමි. | නිවැරදි අගයන් ගිණුම්වල ඇතුලත් කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට සංචිත වටිනාකමක් දක්වා නොතිබුණි. එසේ වුවද එදිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකම ර.13,255,178 ක් වී තිබුණි. | | |
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 7.8 ඡේදය ප්‍රකාරව අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් පසු ලැබෙන අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ දැක්විය යුතු වේ. ඒ අනුව එම වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.8,897,862 ක් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී නියමිත ගණනය කිරීම් සිදු කිරීමට උපදෙස් ලබා දුනි. | |
| (ඇ) | භාණ්ඩාගාර ගිණුම් සටහන් පරිදි 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් ශේෂ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවත්, අමාත්‍යාශයේ එදිනට අත්තිකාරම් ගිණුම් ශේෂය රු.1,318,626 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ දක්වා නොතිබුණි. | උප ලේඛන ඒසීඒ 05 හා ඒසීඒ 05(ඒ) මාරු වීම නිසා මෙම දෝෂය සිදු වී ඇත. ඉදිරියේදී නියමිත ගණනය කිරීම් සිදු කිරීමට උපදෙස් ලබා දුනි. | -එම- |
| (ඇ) | භාණ්ඩාගාර ගිණුම් සටහන් SA-82 හා ශේෂ පිරික්සුම අනුව අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.13,255,178 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.3,038,690 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රු.3,038,690 ක වටිනාකම ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අමාත්‍යාංශයට අයත් පිරිවැය රු.13,500,000 ක්වූ මෝටර් රථ 02 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර ඒ හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | මෝටර් රථ වලට අදාල වන CIGAS පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය තොරතුරු අදාල ආයතනවලින් මෙතෙක් නොලැබීම නිසා තොරතුරු ලද පසු නියමිත යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 යටතේ මාරු කරගත් ප්‍රතිපාදන වර්ෂය අවසන් වනවිටත් උපයෝජනය කර නොතිබුණු අවස්ථා 03 වටිනාකම රු.18,817,526 ක් විය. මාරු කරගත් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතිරි වූ මුදල සියයට 15 සිට සියයට 110 ක් දක්වා පරාසයක විය. | අතිරේක ප්‍රතිපාදන සකසා ගැනීමක් සිදු කළද ඉතිරිවීම් ඇති නොවන පරිදි කටයුතු කිරීම වෙනුවෙන් බොහෝ ක්‍රියාමාර්ග ගනු ලැබුවද අමාත්‍යාංශයට පාලනය කල නොහැකි කරුණු හේතු කොටගෙන බොහොමයක් ඉතිරිවීම් සිදු වී ඇති බව කාරුණිකව වාර්තා කරමි. | මු.රෙ.50 හි සඳහන් නියමයන්ට අනුකූලව ඇස්තමේන්තු පිලියෙල කළ යුතු වීම හා සැලසුම්ගත පරිදි වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 4 ප්‍රකාරව පාර්ලිමේන්තුව මගින් අනුමත කරන අරමුදල් එම මුදල් වර්ෂය තුල සාක්ෂාත් කර ගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික වීම, ගණන්දීමේ නිලධාරීයාගේ වගකීම වුවත්, ඊට පටහැනිව ප්‍රතිපාදන වෙන්කර ගැනීම නිසා අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 84 ක් ඉතිරිව පැවතුණි. | 2021 වර්ෂයේ අමාත්‍යාංශයට පාලනය කළ නොහැකි තත්ත්වයන් මත වීඩියෝ කැමරා හා ඊට අදාල අනෙකුත් උපාංග වෙළඳපලේ නොමැතිවීම, ගොඩනැගිලි කුලියට ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවීම, මාධ්‍ය අංශයට සුවිශේෂී උපාංග සහිතව පරිගණකයක් වෙළඳපලේ නොමැති වීම, බදු සම්බන්ධ ගැටලු නිරාකරණය කරන තෙක් ගෙවීම සඳහා මුදල් නිදහස් කර නොමැති වීම හා විදේශීය උපදේශාත්මක සේවා ප්‍රමාද වීම මත ඉදිකිරීම් කටයුතු අපේක්ෂිත පරිදි සිදු නොවීම යන කරුණු හේතු වී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට සියයට 100 දක්වා ඉතිරියක් සහිත මුලධන වැය විෂයන් 6 රු.1,013,600,664 ක්ද, පුනරාවර්ථන වැය විෂයන් 18 ක රු.37,319,415 ක්ද වූ එකතු වටිනාකම රු.1,050,920,079 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. | ඉතිරිවීම් ඇති නොවන පරිදි කටයුතු කිරීම වෙනුවෙන් බොහෝ ක්‍රියාමාර්ග ගනු ලැබුවද අමාත්‍යාංශයට පාලනය කළ නොහැකි කරුණු හේතු කොටගෙන බොහොමයක් ඉතිරි විම් සිදු වී ඇති බව කාරුණිකව වාර්තා කරමි. | -එම- |

## 2.2 බැඳීම් හා බැරකම්වලට එළඹීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන පරික්ෂාවන් අනුව 2021 වර්ෂය සඳහා වූ රු.300,162 ක බැරකම් 2022 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසයන්හීදි නිරවුල් කර තිබුණු අතර, ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පැවති බැරකම් රු.265,248 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ දිනයන් දැක්වෙන ඉන්වොයිසි හෝ බිල්පත් අඩංගු කිසිදු ගෙවීමක් බැරකමක් ලෙස නොගැනීමක් කර නොමැත. ඒ අනුව 2021 වර්ෂයට අදාළ 2022 වර්ෂයේ ලද බිල්පත් වලට අදාළ ගෙවීම් රු.34,914 ක අගය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. | මු.රෙ 94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව බැරකම් වලට නොඑලඹිය යුතුයි. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | | |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 136, 137, 138 | භාණ්ඩ මිලදී ගැනීමකට අදාල 2021 දෙසැම්බර් 22 දිනැති රු.2,271,400 ක ඉන්වොයිසිය අමාත්‍යාංශය වෙත ලැබෙන විටත් වවුචරය සකස් කර බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම සිදුකර තිබුණි. | ප්‍රෝෆෝමා ඉන්වොයිසිය (Proforma Invoice) මත වවුචරය සකසා චෙක්පත් ලියවා එහි ජායා පිටපතක් සැපයුම්කරු වෙත යවා අදාල භාණ්ඩ ලබාගෙන පිරිවිතර අනුව යෝග්‍යතාවය පරික්ෂා කර බලා භාණ්ඩ වල යෝග්‍යතාව තහවුරු වූ පසු චෙක්පත භාරදීමක් කල බව වාර්තා කරමි. | මුදල් ගෙවීමේදී මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 විදේශ ආධාර ව්‍යාපෘති

---------------------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කන්කසන්තුරේ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී ඉන්දියානු සමාගමක් සමඟ ඇමරිකානු ඩොලර් මිලියන 45.27 ක ණය ගිවිසුමකට එළඹ 2021 දෙසැම්බර් 31 දින වනවිට වසර 03 කට වැඩි කාලයක් ගතවී තිබුණත් වරායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණ. 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ සම්පූරණ ඇස්තමේන්තු ගත පිරිවැය උපදේශන සේවා කටයුතු සඳහා රු.මිලියන 373 ක් හා ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 2000 ක්වූ අතර වර්ෂය සඳහා වෙන්කල මුදල රු.මිලියන 1001 ක්වී තිබුණි. කෙසේ වුවද වර්ෂය තුලදී රු.මිලියන 142.3 ක් උපදේශන සේවා සඳහා පමණක් ගෙවීම් කර තිබූ අතර එය සියයට 38 ක් පමණක් විය. ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබූ නිසා වර්ෂය සඳහා වෙන්කල මුදලින් රු.මිලියන 858.71 ක් ඉතිරිව පැවතුණි. තවද මෙම ව්‍යාපෘතියේ බදු සම්බන්ධව පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට 2021 වර්ෂය තුළ අපොහොසත් වීම නිසා එම වර්ෂයේ බදු සඳහා වූ ප්‍රතිපාදිත මුදල රු.මිලියන 150 සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 මැයි මස 05 වන දින ලබාදී තිබුණද අදාල උපදේශන සේවාව සැපයීම සඳහා ප්‍රසම්පාදන කටයුතු EXIM බැංකුව මගින් සිදුකර ඇත.<br>2020 ඔක්තෝබර් මස 12 දින මූලික උපදේශන කටයුතු ආරම්භ කලද, කොවිඩ් 19 වසංගතය හා දැඩි වර්ෂාපතන තත්ත්වය හේතුවෙන් 2022.05.07 දක්වා දින දීර්ඝ කිරීමක් ලබාගෙන 73% භෞතික ප්‍රගතියක් ලගා කර ගෙන ඇත .<br>2021 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වූ බැවින් කොන්ත්‍රාත් වටිනාකමෙන් 20% ක අත්තිකාරම් මුදල ගෙවීමට නොහැකි වී තිබුණි. තවද වක්‍ර බදු වලින් ව්‍යාපෘතිය නිදහස් කල හැකි වුවත් ඍජු බදු මෙම ව්‍යාපෘතියට අදාළ වනු ඇත. ඒ අනුව 2021 වසරේ බදු මුදල් ගෙවීමක් සිදුකර නොමැති බැවින් 2022 වසරේ සිදුකල ගෙවීම්වලින් 10% වන ලෙස රඳවා ගැනීමේ බදු අයකර ඇත. මින් පෙර ගෙවන ලද බිල්පත්වලට අදාළ රඳවා ගැනීමේ බදු ද, ඉදිරියේදී ලැබෙන බිල්පත්වලින් අඩුකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය ගිවිසුමට එළඹීමෙන් පසු බැඳීම් ගාස්තු ගෙවීමට සිදුවීමේ අවධානමෙන් බැහැර වීම සඳහා සැලසුම් සකස් කිරීමේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි නිෂ්කාශනයන් පිළිබඳ පූර්ව සලකා බැලීමක් කල යුතු බව හා එම කටයුතු සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් වෙන්කල යුතු බව. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල සිදු කර තිබූ රු.2,271,400 ක්වූ කැමරා උපකරණ මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේදී ලංසු ඉදිරිපත් කල යුතු දිනය සඳහන් නොකිරීම, ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන් හෝ නියෝජිතයන් සහභාගි වූ බවට සාක්ෂි නොවීම, ලංසු ලියවිල්ලෙහි ලංසු ප්‍රදානය පිළිබඳ කොන්දේසි ඇතුලත් නොකිරීම, කාර්යසාධන ඇපකරයක් ලබා නොගැනීම හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම යන දුර්වලතාවයන් නිරීක්ෂණය වියත | ප්‍රසම්පාදනයේදී ලියාපදිංචි තැපැල හෝ ඊ-මේල් මඟින් සිදු කිරීම, ලංසු ඉදිරිපක් කිරීමේ අවම දින ගණන සඳහන් කිරීම, ලංසු විවෘත කිරීමේදී ආයතනයේ නියෝජිතයෙකු සහභාගි කරවීමට උපදෙස් දුන් අතර කාර්යසාධන සුරක්ෂිතයක් හා විධිමත් ගිවිසුමක් අත්සන් කර නොමැති බවද ගෙවීමට අදාල වවුචරය සකස් කල පසු ඉන්වොයිසිය ඊට ඇමුණූ බව කාරුණිකව දන්වමි. | 2006 මාර්තු 01 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ අංක 09 දරණ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන වාර්තා කිරීමේ කටයුතු සිදුකල යුතුයි. |

## 4. යහපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් එකී විගණනය කරන ලද අස්ථිකය විසින් භාර ගන්නා ලද නිශ්චිත ව්‍යාපෘතියක් හෝ වැඩසටහනකට හෝ අදාලව හෝ සමස්ථය වශයෙන් පූර්ව නිශ්චය කරගත් අරමුණු ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂමව භාවිත කර ඇති බව සහතික වීම සහ විගණනය කරනු ලබන අස්ථිත්‍යයේ සෑම විගණන සහ කළමනාකරණ අංශයක්ම සමාලෝචනය කිරීම සිදු කල යුතු අතර, එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසරලත් කාලසීමාව තුල එකී පරමාර්ථ සැබැවටම අත්කරගෙන තිබේද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩසහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න සමාලෝචනය කිරීම සිදු කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයක් සිදුකල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 5. මානව සම්පත් කලමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය අවසාන වනවිට රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක්ද, තෘතීයික, ද්වීතීයික සහ ප්‍රාථමික මට්ටම්වල දෛනික කාර්යයන් සඳහා සෘජුව බලපාන සේවක පුරප්පාඩු 36 ක් පැවතුණි. | දුෂ්කරතා මධ්‍යයේ සිටින සීමිත කාර්ය මණ්ඩලය හා නිලධාරී මණ්ඩලය උපයෝගී කරගෙන ගැටළුවක් ඇති නොවන පරිදි හා අමාත්‍යාංශයේ අරමුණ ඉටුකර ගැනීමට හැකි වන අයුරින් මේ දක්වාම කටයුතු කර ගැනීමට හැකි විය. | අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතුය. |